**සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම - 2019**
--------------------------------------------------------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
----------------------------

සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරණු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකැසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගැයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතු වේ. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගත සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් බදු පෙර ලාභය ගණනය කිරීමේදී රු.4,007,643 ක ප්‍රත්‍යාගණන ලාභයද බදු පෙර ලාභයට එකතුකර තිබීම නිසා බදු පෙර ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසාන ගිණුම්වලින් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ආ) | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී රු. 9,210,590 ක් වූ වර්ෂ අවසාන ප්‍රාග්ධන ජෛව තොගයද ඇතුළත් කිරීම හේතුවෙන් දළ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසාන ගිණුම්වලින් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දැක්විය යුතු වර්ෂයේ වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු අගයන්හි වෙනස්වීම්වල බලපෑම මත මුදල් ගලා ඒමක් ලෙස දැක්විය යුතු රු. 2,506,495 ක් මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසාන ගිණුම්වලින් නිවැරදි කරන බව දන්වමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදි කිරීමට පියවර ගතයුතුය. |
| (ඈ) | ගොවිපල 2 කට අදාලව ගොඩනැගිලි ක්ෂය රු.238,750 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | ගොඩනැගිලි ක්ෂය වැඩියෙන් ගණනය කිරීම 2020 වර්ෂයේ අවසන් ගිණුම්වලින් නිවැරදි කරන බව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළයුතුය. |

### 1.5.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල 7.4 (අ) වගන්තිය ප්‍රකාරව තොග වෙනස් වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුහුණත වෙනම ඉදිරිපත් කල යුතු වුවත් රු 1,853,393 ක් වූ තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වෙනම දක්වා නොතිබුණි. | 2020 වර්ෂයේදී තොග වෙනස්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම දැක්වීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට පියවර ගතයුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතවල 7.4 (ඇ) වගන්තිය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා යාමක් ලෙස සැලකිය යුතු රු. 422,992 ක පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසාන ගිණුම්වලින් නිවැරදි කරන බව දන්වමි. | ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට පියවර ගතයුතුය. |

**1.5.3 අවිනිශ්චිත ගිණුම**

| විෂයය | මුදල<br>රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2015 වර්ෂයේ සිට පැවත එන, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ ණයගැතියන් යටතේ දක්වා ඇති අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | 13,010,825 | වසර 04 | අවිනිශ්චිත ගිණුම 2020 වර්ෂයේදී පියවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළයුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | <u>පොදු සංචිතය</u> | | | | |
| | මහවැලි ආර්ථික ඒජන්සිය | 403,962,731 | වටිනාකම සනාථ කරගත හැකි සාක්ෂි | මෙම වටිනාකම්වලට අදාල කිසිදු සාක්ෂියක් සමාගම සතුව නොමැත. 1999 වර්ෂයේදී පශු සම්පත් අංශය සමාගමක් බවට පත්කරන ලද අවස්ථාවේදීද මෙම ශේෂයන් ඉදිරියට ගොස් ඇත. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |
| | කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | | | |
| | යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට අදාල ලියවිලි | | |
| | විදේශ ආධාර | 5,729,782 | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **(ආ)** | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු<br>ගෙවිය යුතු එකතුකල අගය මත බදු | 285,185<br>2,991,095 | **ශේෂ තහවුරු කිරීම් හා බදු සහතික පත්‍ර** | ඉදිරි වර්ෂයේදී තහවුරු කිරීමේ ලිපි ලබාගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය. |
| **(ඇ)** | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු<br>අත්තිකාරම්<br>දම්මින්න අන්තර් ගොවිපල ශේෂ | 165,600<br>163,192<br>818,177 | ශේෂ තහවුරු කිරීම් | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබාගැනීමට හැකියාවක් නොමැති බැවින්, 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ලියාහැරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br>මෙම ශේෂ 2020 වර්ෂයේදී තහවුරු කිරීම් ඉදිරිපත් කරන බව දන්වා සිටිමි.<br>දම්මින්න ගොවිපල ශේෂය 2020 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | ශේෂ සනාථන විගණනයට සෘජුව ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්විය යුතුය.<br>. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණු නිරාවිය ගොවිපල සතුව තිබුණු රු. 5,820,430 ක් වූ පශු සම්පත් තොගයේ වටිනාකම සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අයකරගෙන නොතිබුණි. | දිගින් දිගටම මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කර ඇති අතර, 2020 වර්ෂයේදී මෙම ශේෂය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී සිදුකළ වැටුප් සංශෝධනයට අනුව සේවකයින්ට | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ පසු මෙම වෙන් | ගෙවිය යුතු මුදල් ගෙවීමට නොපමාව |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතු රු. 6,893,711 ක හිඟ වැටුප් සහ ඊට අදාල රු. 1,817,553 ක සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා වෙන් කිරීම් සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද ඒවා ගෙවා නොතිබුණි | කිරීම් ගෙවා දැමීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි. | පියවර ගතයුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්ති බාර අරමුදලට ගෙවිය යුතු පිළිවෙලින් රු.15,047,670 ක සහ රු.505,026 ක දායක මුදලක් නොගෙවා තිබීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය ආරම්භ වූ පසු පියවා දැමීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගෙවිය යුතු මුදල් ගෙවීමට නොපමාව පියවර ගතයුතුය. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,663,531 ක පාඩුවක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 4,428,901 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 234,630 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාගමේ ව්‍යාපාර කටයුතු ප්‍රතිසංවිධානය නොකිරීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර, මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි. | මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක කර තිබුණු ක්‍රියාකාරකම් යටතේ ඉලක්කගත නිෂ්පාදනය තත්‍ය නිෂ්පාදනය සමඟ සැසඳීමේදී බොයිලර් | නිෂ්පාදන ගබඩා කිරීමට ශීතාගාර නොමැතිකම හා සතුන් ඇතිකරනු ලබන කොටු අබලන් තත්ත්වයක පැවතීම | ඉලක්කගත නිෂ්පාදනය ලඟාකර ගැනීමට අවශ්‍ය වූ ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| | කුකුල් මස් නිෂ්පාදනය සියයට 22 ක් ද, ඌරු මස් නිෂ්පාදනය සියයට 10ක් ද, එළුවන් ඇති කිරීම සියයට 24 ක් ද, වශයෙන් අඩු අගයක් ගෙන තිබුණි. | නිසා මෙම තත්ත්වය උද්ගතවී ඇත. රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය අවසන්වූ පසු මෙම තත්ත්වය මඟහරවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගතයුතුය. |
| (ඇ) | සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රු. 3,162,812 ක් වූ වාහන 04 ක් හා සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු. 14,929,159 ක් ලෙස දක්වා තිබුණද, එම වත්කම් සමාගමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම රථ වාහන 2020 වර්ෂයේ දී පවරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. දෙමටගොඩ පිහිටි ඉඩමෙහි වටිනාකම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත මාරු කිරීමට 2020 වර්ෂයේදී කටයුතු කරන බව දන්වා සිටිමි. | භාවිතා කරනු ලබන වාහනවල අයිතිය සමාගම වෙත පවරා ගැනීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | ගිරාදුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටා තිබුණු කිරි සැකසුම්හල ආරම්භ කරන ලද 1986 වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මඟින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරන අතර කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ බිම ටයිල් කැඩී ගොස් තිබීම, වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලා තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීමේ පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා නිෂ්පාදනවල සෞඛ්‍යාරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටළු පැන නැඟී තිබුණි. | මෙම තත්ත්වය නිරාකරණය කර ගැනිමට රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර කටයුතු අවසන් වූ පසු ක්‍රියාකරන බව දන්වමි. | නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත ගැටළු ඇතිවීමට තුඩුදෙන හේතූන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඉ) | සමාගම සතු ගිරාදුරුකෝට්ටේ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී රු. 12,501,900 ක් වැයකර ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු. 8,967,600 කට අගය කර 2016 පෙබරවාරි 08 දින මෙම සමාගමට පවරාදී තිබුණද, මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | මෙම වත්කම් පරිහරණය කිරීමට සතුන් මිලදී ගැනීමට ප්‍රාග්ධන හැකියාවක් සමාගම සතුව නොමැති බැවින්, රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ආරම්භ වූ පසු මෙම වත්කම් නිසි පරිදි භාවිතයට ගන්නා බව දන්වා සිටිමි. | මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේද සකසා ගතයුතුය. |
| (ඊ) | 2016 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණු රු. 859,256 ක් වටිනා අබලි ද්‍රව්‍ය සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද අපහරණය කර නොතිබු අතර සමාලෝචිත වර්ෂයේදී එම අබිලි ද්‍රව්‍ය ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණි. | මෙම අපහරණය කළයුතු භාණ්ඩ 2020 වර්ෂයේදී අපහරණය කර අවසන් කරන බව දන්වා සිටිමි. | අබලි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා කටයුතු කළ යුතුය. |